**12-02-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, දැන් මේ ඇත්තේ සියල්ල සමනය වී යන කාලයයි. රාවණ විසින් සෑම සියලු දෙනාවම සොහොන් බිමේ වළ දමා ඇත. පරමාත්ම පියා පැමිණ සිටින්නේ අමෘතයේ වැසි වස්සවා ඔබලා තමා සමග ආපසු ගෙන යාමටයි.

**ප්‍රශ්නය:** නිධන් ගබඩාවේ අහිංසක ස්වාමියා ලෙස ශිව බාබාව හඳුන්වන්නේ ඇයි?

**පිළිතුර:** කිසිම ගුණධර්මයක් නොමැති අයටත්, ගල් බුද්ධි ඇති අයට හා අංගවිකල වූවන්ටත් යහපතක් සලසා ඔවුන්වත් ලෝක පාලකවරුන් කරවන්නේ අහිංසකත්වයේ ස්වාමියා වන ශිවාම පැමිණි විට පමණක් වන නිසාවෙනි. ඔහු අපිරිසිදු ලෝකයේ අපිරිසිදු ශරීරයකට පැමිණේ. ඔහු එතරමම අහිංසකයි. අහිංසකත්වයේ ස්වාමියාගේ උපදෙස් නම්: සුමිහිරි දරුවනි, අමෘතය පානය කර පාප විස අතහැර දමන්න...

**ගීතය:** දුර ඈත දේශයේ වැසියාණන් විදේශයට පැමිණ සිටියි...

ඕම් ශාන්ති. ඔය ආධ්‍යාත්මික දරුවන්ට ගීතය ඇසුණා. ජීවාත්මයන් වන ඔබලා ඔබගේ භෞතික ඉන්ද්‍රිය වන කණ හරහා ගීතයට ඇහුම් කන් දුන්නා. මේ පැමිණෙන්නා පැමිණෙන්නේ දුර ඈත දේශයක ඉඳලයි. ඔබලාත් එසේ ගමන් කරන්නන්ය. මෙහි සිටිනා සෑම මානව ජීවාත්මයක්ම ගමනේ යෙදෙන්නන්ය. ජීවාත්මයන්ට නිවහනක් නොමැත. ජීව අභෞතිකයි. අභෞතික ජීවාත්මයන් අභෞතික ලෝකයේ වාසය කරති. එය හඳුන්වන්නේ අභෞතික ජීවාත්මයන්ගේ නිවහන. දේශය හෝ ලෝකය කියලායි. මෙයට කියන්නේ මානව ජීවයන්ගේ දේශය කියලයි. එය ජීවාත්මයන්ගේ දේශයයි. ජීව මෙහි පැමිණ ශරීරගත වුණු විට ඔවුන් අභෞතික බවින් භෞතික වෙනවා. ජීවයන්ට රූපයක් නැහැයි කියා කියන්න බැහැ: ඔවුන්ට අනිවාර්යෙන්ම රූපයකුත් නමකුත් තිබෙනවා. එවන් කුඩා ජීවාත්මයක් ශරීරයක් හරහා විශාල චරිත කොටසක් රඟදක්වනවා. සෑම ජීවාත්මයක් තුළම විශාල චරිත කොටසක් සනිටුහන් වී තිබෙනවා. වරක් පටිගත වුණු දෙයක් තමාට ඕනෑ ලෙසින් තවත් වාර ගණනාවක් එයම නැවත නැවතත් තිරගත කර ගත හැකියි. මෙම ශරීරය තුළ සිටිනා ජීවාත්මයේත් උපත 84 ක චරිත කොටසක් පටිගත වී තිබෙනවා. පරමාත්ම පියා අභෞතික වූවාක් සේ ජීවාත්මයනුත් අභෞතිකයි. ග්‍රන්ථ වල ඇතැම් පරිච්ඡේදයන්හි ජීවාත්මයන්ට නමක් හා රූපයක් නැතැයි කියා සඳහන් වී තිබෙනවා - අහස- නමක් නොමැති කිසිවක් තිබිය නොහැකියි. මිනිසුන්: පරමාත්ම පියා පරමාත්ම ජීවය කියා කියනවා. සෑම ජීවාත්මයක්ම දුර ඈත දේශයේ වාසය කරන්නනුයි. මෙම භෞතික භූමිය දෙදෙනෙක් මඟින් පාලනය වෙනවා රාම රාජ්‍යය හා රාවණ රාජ්‍යය: කල්ප බාගයක් පුරා රාම රාජ්‍යය වන අතර ඉතිරි කල්ප බාගය පුරා ඇත්තේ රාවණ රාජ්‍යයයි. පරමාත්ම පියා තම දරුවන්ට දුක්ඛිත රාජ්‍යයක් නිර්මාණය කර දෙන එකක් නැහැ නේද? දුකත් සතුටත් දෙකම දෙන්නේ දෙවියන්මයි කියා මිනිස්සු කියනවා. පමාත්ම පියා පැහැදිලි කර කියනවා: මම කවදාවත් දරුවන්ට දුකක් දෙන්නේ නැහැ. මගේ නම දුක නැති කර සතුට දානය කරන්නායි. මෙම වැරැද්ද කර ඇත්තේ මිනිසුන් විසිනුයි. දෙවියන් කවදාවත් දුක් දෙන්නේ නැහැ. දැන් මේ කාලයේ ඇත්තේ දුක්ඛිත ලෝකයකි. කල්ප බාගයක් පුරාවට ඇත්තේ රාවණ රාජ්‍යයයි. එහි ඇත්තේ දුකම පමණි: සතුටක සේයාවක්වත් එහි නොමැත. කෙසේවෙතත්, සතුටු දේශයේ කිසිම දුකක් නොමැත. පරමාත්ම පියා දෙව්ලොව නිර්මාණය කරයි. ඔබ දැන් සිටින්නේ සංගම යුගයේයි. කිසිම කෙනෙක් මෙයට නව ලෝකය යයි කියන්නේ නැත. නව ලෝකයේ නම ස්වර්ණමය යුගය යන්නයි. එය පැරණි වුණු විට කලි යුගය යයි කියති. අලුත් දෙයක් හොඳ වන අතර පැරණිදෙයක් නරක වේ. පැරණි දේ පසුව විනාශ කර දමයි. මිනිස්සු සතුටයි කියා සලකන්නේ විෂකුරු දේයි. අමෘතය අතහැර ඇයි අපි වස පානය කරන්නේ කියා කියනවා. ඔබ නිසා සැමටම යහපත උදාවෙනවා. ඔබ පැමිණි විට ඔබ කරනා ඕනෑම දෙයකින් සිදු වන්නේ යහපතයි කියා කයනවා. නැතිනම් මිනිස්සු රාවණ රාජ්‍ය යේදී නොනවත්වාම කරන්නේ නරක දේයි. ගුරුනානක් පැමිණ ගිහින් වසර 500 ක් ගත වී ඇති බව ඔය දරුවන් දන්නවා. නැවතත් ඔහු පැමිණෙන්නේ කවදාද? ඔහුගේ ජීවය ආලෝකයට මුසු වුණා කියා කියනවා. එමනිසා, ඔහු පැමිණෙන්නේ කෙසේද? වසර 4500 කට පසුව නැවතත් ගුරු නානක් පැමිණේවි කියා ඔබ කියනවා. මුලු ලෝකයේම ඉතිහාසය හා භූගෝලය ඔබගේ බුද්ධියේ කැරකෙමින් පවතිනවා. මේ කාලයේදී සෑම කෙනෙක්ම තමෝප්‍රධාන්. මෙය හඳුන්වන්නේ සියල්ල සමනය වී යන කාලය ලෙසයි. සෑම මිනිසෙක්ම මිය ගිහින් වගේයි. සෑම ජීවාත්මයකම

ආලෝකය නිවී ගිහින්. පරමාත්ම පියා පැමිණෙන්නේ සෑම කෙනෙක්වම අවදි කරවීමටයි. පරමාත්ම පියා අමෘතය නහවා රාග ගින්නේ අසුන් ගෙන දැවී හළු වුණු දරුවන්ව නැවතත් අවදි කරවා ඔවුන්ව තමා සමඟ ආපසු ගෙන යනවා. මායා, රාවණා ඔබව රාග ගින්නේ හිඳවා සොහොන් බිමේ වළ දමා ගිහින්. සෑම කෙනෙක්ම සිටින්නේ ඒ නිද්‍රාවේයි. පරමාත්ම පියා දැන් ඔබට ඥාන අමෘතය බීමට සලස්වනවා. මෙම ඥාන අමෘතය හා ඒ ජලය අතර ලොකු වෙනසක් තිබෙනවා. සීක් ජාතිකයින් වැදගත් දිනයක දී වැවක් පිරිසිදු කර මහා ඉහළින් එහි මඩ ඉවත් කරනවා. ඒ නිසා තමයි එයට අම්රිත්සාරය - අමෘත වැව- කියා කියන්නේ. ගුරු නානාක් පවා පරමාත්ම පියාගේ ගුණ ගයා: සත්‍ය පවසන්නේ ඔහුම පමණයි කියා කිව්වා. සත්‍ය නාරායන වීමේ කතාන්දරයක් තිබෙනවා නේද? භක්ති මාර්ගයේදී මිනිස්සු විවිධ කතාන්දර අස අසා සිටියා: අමරණීයත්වයේ කතාන්දරය. තෙවෙනි ඇසේ කතාන්දරය. ශංකර් පාර්වතීට කතාන්දරයක් කිව්වා කියා ඔවුන් කියනවා. ඔහු සූක්ෂම කලාපයේ වැසියෙකි. ඔහු එහි සිට මොන කතා කියන්නද? පරමාත්ම පියා මෙහි සිට මේ සියලු කරුණු කාරණා පහදා දෙනවා. ඇත්තටම කියනවා නම්, මා පැමිණ සිටින්නේ අමරණීයත්වයේ කතාන්දරය කියා දී ඔබව අමරණීය දේශයට ගෙන යාමටයි. මම ඔබව මරණීය දේශයෙන් අමරණීය දේශයට ගෙන යනවා. සූක්ෂම කලාපයේ සිටිනා පාර්වතී මොන වරදක් කළාට ද අමරණීයත්වයේ කතාව අහන්න වන්නේ? ග්‍රන්ථ වල එක් එක් ආකාරයේ කතාන්දර රැසක් ලියා තිබෙනවා. සත්‍ය නාරායන් වීමේ කතාව ඇත්ත කතාවක් නොවෙයි. සත්‍ය නාරායන්ගේ කතාව ඔබ නොයෙක් වර අසා ඇති. ඒක ඇහුවයි කියලා කවුරුවත් සත්‍ය නාරායන වෙනවා ද? ඒ වෙනුවට තව තවත් ඇද වැටීමම තමයි සිදු වන්නේ. අපි දැන් මිනිසෙකුගෙන් නාරායන බවටත් කාන්තාවකගෙන් ලක්ෂ්මී බවටත් පත් වන බව ඔබලාට දැන් තේරෙනවා. අමරණීයත්වයේ දේශය කරා යාමට ඇති සත්‍යය නාරායනගේ සත්‍ය කතාව මෙයයි. තෙවෙනි ඇසේ සත්‍ය කතාව මෙයයි. ඔය සෑම ජීවාත්මයක්ම ඥානයේ තෙවෙනි ඇස ලබා සිටිනවා. පරමාත්ම පියා පහදා කියනවා: ඔබලා ලස්සනට වන්දනීයව සිටියා. උපත් 84 ක් ගෙන පැමිණෙන අතර ඔබලා වන්දනාකරුවන් වෙලා. මෙන්න මේ නිසා තමයි: වන්දනා ලබන්නේත් වන්දනා කරන්නේත් ඔබලාමයි කියා කියන්නේ. පරමාත්ම පියා කියනවා: මම සෑම විටම වන්දනීයයි. මම වන්දනා කරනා ඔබලාව වන්දනීය අය බවට පත් කරවනවා. මෙය අපිරිසිදු ලෝකයයි. ස්වර්ණමය යුගයේදී මිනිස්සු පාරිශුද්ධ සේම වන්දනීය වේ. දැන් සෑම මිනිස් ජීවයක්ම අපිරිසිදු වන්දනාකරුවන් බවට පත්ව ඇත. සන්නාසීන් හා පූජකවරුන් අහෝ සීතාරාම් පතිතපාවන කිය කියා ගීත ගය ගයා සිටියා. මේ වචන නිවැරදියි. සෑම කෙනෙක්ම සීතාවක් මනාලියක්. අහෝ රාමා පැමිණ අපව පාරිශුද්ධ කරවන්න කියා ඔවුන් ගායනා කළා. සෑම භක්තිවන්තයෙක්ම, ජීවාත්මයක්ම අහෝ රාමා කියා ගී ගැයුවා. ගාන්ධිතුමා ගීතාව කියවා අවසන් කළ විට - පතිතපාවන සීතිරාම් - කියා කිව්වා. ගීතාව දේශනා කළේ ක්‍රිෂ්ණා නොවන බව දැන් ඔබට වැටහෙනවා. බාබා කියනවා: දෙවියන් සෑම තැනකම සිටින්නෙක් නොවෙයි යන්නට සෑම කෙනෙකුගෙන්ම අදහස් ගන්න. ගීතාවේ දෙවියන් වන්නේ ශිවා මිසක් ක්‍රිෂ්ණා නොවෙයි. පළමුවෙන්ම, ගීතාවේ දෙවියන් කියා කිව හැක්කේ කාටදැයි කියා අහන්න දෙවියන් කියා කිව හැක්කේ කාටද?: අභෞතික කෙනාට ද භෞතික කෙනාට ද? ක්‍රිෂ්ණා භෞතිකයි. ශිවා අභෞතිකයි. ඔහු කරන්නේ මෙම ශරීරය ණයට ගැනීමක් පමණයි. ඔහු මව් කුසකින් උපත ලබන්නේ නැහැ. ශිවාට තමාටම කියා ශරීරයක් නැහැ. භෞතික ශරීර ඇත්තේ මෙම මානව ලෝකයේ පමණයි. පරමාත්ම පියා පැමිණ සත්‍ය නාරායන වීමේ සත්‍ය කතාව කියා දෙනවා. පරමාත්ම පියා පාරිශුද්ධකරු. සැමගේ මුක්තිදායක. සැමගේ ගැලවුම්කරු. දුක නැති කර සතුට දානය කරන්නා කියා කියනවා. අච්චා. සතුට ඇත්තේ කොහිද? මෙහි තිබිය නොහැකියි. දෙව්ලොව ස්ථාපනය වී පැරණි ලොව විනාශ වුණු විට ඊළඟ උපතේදී ඔබට සතුට ලද හැකියි. අහා, ඔබව මුදවන්නේ කුමකින් ද? රාවණාගේ දුකින්. මෙය දුක්ඛිත ලෝකයයි. අච්චා. ඔහු මඟපෙන්වන්නාත් වෙනවා. මෙම ශරීර මෙහිදී විනාශ කර දමා ජීවාත්මයන්ව ආපසු ගෙන යනවා. පළමුව මනමාලයා යන අතර ඔහු පසුපසින් ඔහුගේ මනාලියන් ගමන්කරනවා. ඔහු අමරණීය කඩවසම් මනමාලයායි. ඔහු සෑම කෙනෙක්වම දුකින් මුදවා ඔවුන්ව පාරිශුද්ධ කර නැවතත් නිවහනට කැන්දාගෙන යනවා. මංගල පෙරහැරක. මුලින්ම ගමන් කරන්නේ ස්වාමිපුරුෂයායි. ඔහු පසු පසින් ඔහුගේ බිරිඳ වන මනාලියත් ඇය පසුපසින් ඉතිරි පිරිසත් පෙළට ගමන් කරනවා. ඔබගේ රෝසරියත් මේ වාගේයි. ඉහළින්ම මුදුන් මලින් පෙන්වන ශිව බාබාට ගරු නමස්කාර කරනවා. පසුව බාබාගේ සහායකයින් වන බ්‍රහ්ම - සරස්වතී ද්විත්වය සිටිනවා. ශිව බාබා සිහි කිරීමෙන් පමණයි ඔබ සූර්ය වාංශිකයෙක් හා විෂ්ණු මාලාවේ කෙනෙක් වන්නේ. ලක්ෂ්මී හා නාරායන වන්නේ සරස්වතී හා බ්‍රහ්මායි. ලක්ෂ්මී හා නාරායන සරස්වතී හා බ්‍රහ්මා වෙනවා. ඔවුන් වන්දනීය වන්නේ ඔවුන් දැරූ උත්සාහය නිසායි. රෝසරයකින් පෙන්වන්නේ කුමක්දැයි කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. කිසිම තේරුමකින් තොරව ඔවුන් නවගුණ වැලක් ගණන් කරනවා. 16,108 ක රෝසරියක් තිබෙනවා. එය

තබා ඇත්තේ විශාල දේවාල වලයි. එක් එක් අය එක් එක් තැන් වලින් එය ගෙන කරකවනවා. බාබා බොම්බෙ නුවර ඇති ලක්ෂ්මී නාරායන දේවාලයට ගිය විට රාමා නම ජප කරමින් රෝසරිය කැරකවූවා. මාලාවේ මුදුන් මල වන්නේ පරමාත්ම පියා වන රාමායි. එම මලට තමයි රාමා කියන්නේ. මිනිස්සු එම මාලාවට නමස්කාර කරනවා. ඔවුන්ට ඥානයක් නැහැ. පූජකවරුනුත් තම අතේ රෝසරියක් තබා ගෙන සිටිනවා. ඔවුන් කරකවන්නේ කාගේ රෝසරියද කියා අහන්න. ඔවුන් දන්නේ නැහැ. ක්‍රිස්තූන් සිහි කරමින් තමන් එය කරනවායි කියා ඔවුන් කියනවා. ක්‍රිස්තු ජීවය සිටින්නේ කොහිදැයි කියා ඔවුන් දන්නේ නැහැ. ක්‍රිස්තු ජීවය දැන් තමෝප්‍රධාන් වී සිටිනා බව ඔබට තේරෙනවා. ඔබලාත් තමෝප්‍රධාන් යාචකයිනුයි. ඔබලා දැන් යාචකයින්ගෙන් රාජකුමාරවරුන් වෙමින් සිටිනවා. භාරතය රාජකුමාරයෙක්ව සිටියා: දැන් යාචකයෙක් වෙලා. දැන් නැවතත් එය රාජකුමාරයෙක් වේවි. ඔබලාව ඒ තත්ත්වයට පත් කරවන්නේ පරමාත්ම පියායි. ඔබලා මිනිසුන්ගෙන් රාජකුමාරවරුන් වෙමින් සිටිනවා. රාජ කුමාරයින් හා කුමාරියන් ඉගෙන ගන්නා කුමර විද්‍යාලයක් තිබුණා. මෙහි ඉගෙන ගැනීමෙන් ඔබලා උපත් 21 කටම දෙව්ලොව රාජකුමාරයින් හා කුමාරිකාවන් වෙනවා. මේ ශ්‍රී ක්‍රිෂ්ණා රාජ කුමාරයෙකි. ඔහුගේ උපත් 84 කතාව ලියා තිබෙනවා. මිනිස්සු මොනවාද දන්නේ? මේ කරුණු කාරණා තේරුම් ගන්නේ ඔබලා පමණයි. පරමාත්ම දෙවියන් කතා කරයි. ඔහු සැම දෙනාගේම පරමාත්ම පියායි. ඔබලා දෙව්ලොව ස්ථාපනය කරනා පරමාත්ම පියාට ඇහුම් කන් දෙනවා. එයට කියන්නේ සත්‍යයේ දේශය කියලයි. මෙය මිත්‍යාවේ දේශයයි. සත්‍ය දේශය ස්ථාපනය කරන්නේ පරමාත්ම පියායි. රාවණ ස්ථාපනය කරන්නේ මිත්‍යා දේශයයි. රාවණගේ පඹයෙක් සෑදුවත් ඔවුන්ට ඒ කිසිවක් තේරෙන්නේ නැහැ. තමා විසින් මරා දැමුවත් නැවතත් හිස ඔසවන ඒ රාවණ කවුදැයි කියා කිසිම කෙනෙක් හරියටම දන්නේ නැහැ. පිරිමියෙකුගේ පංච පාපයනුත් ස්ත්‍රියකගේ පංච පාපයනුත් එකතු වුණු තැන රාවණ කියන්නේ. මිනිස්සු ඔහුව පුළුස්සා දමනවා. රාවණ මරා දැමූ පසු ඔවුන් රත්තරන් (ගසෙහි එල්ලා ඇති රන් ආලේපිත මල්) සොරා ගන්නවා. මෙය කටු කැළයක් බව ඔය දරුවන්ට තේරෙනවා. බොම්බෙ නුවර බබුල්නාථ (කටු වලටඅධිපති දෙවියන්) වෙනුවෙන් දේවාලයක් තිබෙනවා. පරමාත්ම පියා පැමිණ කටු මල් බවට පත් කරනවා. කටු කැළයක් කියා කියන්නේ සැම කෙනෙක්ම රාගය නම් වූ පාපයෙන් එකිනෙකාට හිංසා කරගන්නා නිසායි. ස්වර්ණමය යුගය අල්ලාගේ මල් වත්ත කියාත් හඳුන්වනවා. ඒ මල්ම පසුව කටුවෙනවා. පසුව ඒ කටු නැවතත් මල් වෙනවා. ඔබ දැන් පව පංච මහා පාපයන්ගෙන් ජය ගන්නවා. රාවණ රාජ්‍යය අනිවාර්යෙන්ම විනාශ කර දැමිය යුතුයි. අවසානයේදී ප්‍රධාන යුද්ධය සිදුවේවි. සැබෑ දශේරාව ක්‍රියාත්මක වීමටයි යන්නේ. රාවණ රාජ්‍යය විනාශ වුණු විට ඔබ ලංකාව මංකොල්ල කා ගනීවි. බාබා, ශිව,නිධන් ගබඩාවේ අහිංසක ස්වාමි වන්නේ ඔහු ඔබට මුළු අධිරාජ්‍යයම භාර කරනා නිසායි. ගුණදහමක් නොමැති ගල් බුද්ධි ඇති අංග විකලවූවන්ව පරමාත්ම පියා ලෝක අධිපතීන් කරවනවා. ඔහු එතරම්ම අහිංසකයි. ඔහු අපිරිසිදු ලෝකයට පැමිණ අපරිසිදු ශරීරයකට ඇතුළු වේ. දෙව්ලොවට යාමේ සුදුසුකම නොමැත්තන් වස පානය නතර නොකරයි. පරමාත්ම පියා කියනවා: දරුවනි, දැන් මේ ඔබගේ අවසන් උපතේ දී පාරිශුද්ධ වන්න. පාපයන්ගේ ආරම්භයේ පටන් අගදක්වාම විදීමට සිදුවන්නේ දුකයි. මෙම එක උපතට වස පානය නතර කරන්න බැරිද? මම ඔබට අමෘතය දී ඔබලාව අමරණීය කරවනවා. එහෙම වෙලත් ඔබ පාරිශුද්ධ වන්නේ නැහැනේ. වස, දුම්වැටි, මත්පැන් නැතිව ඔබට ඉන්න බැහැ. මම අසීමිත පරමාත්ම පියා ඔබට කියන්නේ: දරුවනි, මේ එක් උපතට පාරිශුද්ධ වන්න. මම ඔබව දෙව්ලොව පාලකවරුන් කරවමි. පැරණි ලෝකය විනාශ කර නව ලෝකය ස්ථාපනය කිරීම පරමාත්ම පියාගේම කාර්යය පමණි. පරමාත්ම පියා පැමිණ සිටින්නේ මුලු ලෝකයම දුකින් මුදවා ගෙන සැම කෙනෙක්වම සාමයේ දේශය හා සතුටේ දේශයට ගෙන යාමටයි. දැන් සැම ආගමක්ම විනාශ වීමටයි යන්නේ. නැවතත් වතාවක් ආදි සනාතන දේවි දේවතා ධර්මය ස්ථාපනය වෙමින් පවතිනවා. සීක් ධර්මයේ ග්‍රන්ථයේ පවා පරමාත්ම ජීවය පරමාත්ම පියා අමරණීය දේශයක් කියා කියනවා. පරමාත්ම පියා මරණයේ අධිපතියි. මහා මාරයායි. ඒ මාරයා ගෙන යන්නේ එක්කෙනයි දෙන්නයි. මම සැම කෙනෙක්වම ආපසු ගෙන යන නිසා තමයි මට මරණයට අධිපතියි කියන්නේ. පරමාත්ම පියා පැමිණ ඔය දරුවන්ව ඉතාමත් ප්‍රඥාවන්තයින් කරවනවා. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. මෙම අවසන් උපතේදී වස පානය කිරීම අතහැර දමන්න. අමෘතය පානය කර අන් අයවත් ඒ සඳහා දිරිමත් කරවන්න. ඔබ පාරිශුද්ධ විය යුතුයි. කටු මල් කරවීමේ සේවය කරන්න.
2. විෂ්ණුගේ ගෙලවටා රැඳි රෝසරියේ බීජයක් වීමට නම් පරමාත්ම පියා පිළිබඳ වූ සිහියේම සිටින්න. මුළුමනින්ම සහයෝගශීලි වී පරමාත්ම පියා සේම දූක නැති කරවන්නෙක් වන්න.

**වරදානය:** ඔබ මාස්ටර් ඥාන සූර්යයෙකු වී ඔබගේ අධ්‍යාත්මික ආකල්පයෙන් සියලු ජීවාත්ම කෙරෙහි බලපෑමක් ඇති කරත්වා.

ආකර්ෂණීය දෙයක් අන් අයව තමා වෙතට ඇද ගන්නා අතර සෑම කෙනෙකුගේම අවධානය ඒ වෙත යොමු වේ. එලෙසම, ඔබේ ආකල්පය ලෞකික නොවන නමුත් ආධ්‍යාත්මිකත්වයෙන් පිරී ඇති විට, එහි බලපෑම ඉබේටම බොහෝ ජීවාත්මයන්ට බලපෑමක් ඇති කරයි. ආධ්‍යාත්මික ආකල්පයක් යනු බොහෝ ජීවාත්ම ඉබේටම ආකර්ෂණය කරන ළබැඳි සහ නොබැඳි අවධියයි. එවැනි ආධ්‍යාත්මික සහ බලවත් ජීවාත්ම මාස්ටර් ඥාන සූර්යයන් බවට පත් වී සෑම තැනකම ඔවුන්ගේ ආලෝකය පතුරුවාලයි.

**පාඨය:** ඔබේ ආත්ම ගරුත්වයේ ආසනයේ නිරන්තරයෙන් රැඳී සිටින්න, එවිට ඔබේ සියලු බල ඔබේ නියෝග පිළිගනු ඇත.

***** ඔම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: එකමුතුකම සහ විශ්වාසයේ විශේෂත්වයෙන් සාර්ථකත්වයෙන් පිරිපුන් වන්න.**

ඥානයෙන් පිරී සිටීමත් සමඟම, සෙනෙහෙවන්ත වන්න. ස්ව සේවය ලෝක සේවය සඳහා පදනමයි. සේවයේ දී, වාක්‍ය දෙකක් මතක තබා ගන්න: 1) මම උපකරණයක්. 2) මම අනිවාර්යෙන්ම නිහතමානී විය යුතුයි. මේ ආකාරයෙන් එකමුතුකමේ වාතාවරණයක් නිර්මාණය වන අතර ඔබ එකිනෙකා සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ඇත. "මගේ" සහ "ඔබගේ", ගෞරවය සහ ගරුත්වය යන ගැටුම් සියල්ල අවසන් වනු ඇත.